# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2258/47 - 2021 දෙසැම්බර් මස 17 වැනි සිකුරාදා - 2021.12.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, බිංගිරිය උඩුබද්දාව ජල සම්පාදන ව්‍යාපෘතියේ (අදියර I) හි උඩුබද්දාව වැඩභාර නිලධාරි කාර්යාලයට නල ගබඩා පහසුකම් සඳහා අතිරේක ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/03/KG/325.

2021 දෙසැම්බර් මස 13 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.


1A - G 35588 — 43 (2021/12)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1504, ඉහළගම දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උඩුබද්දාව - ඉහළගම ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු ඇනස්ලි වී. ලියනගේ මහතා විසින් මැන සකස් කරන ලද අංක 5306 දරන මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක "B" වශයෙන් දැක්වෙන "කෝන්ගහමුලහේන වත්ත" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 13ක් පමණ වන ඉඩම් කොටස.

කැබලි අක්ෂර : B
ඉඩමේ නම : කෝන්ගහමුලහේන වත්ත
ප්‍රමාණය : පර්චස් 13

*මායිම් :*

*උතුරට* : බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක මහතා විසින් මැන සකස් කරන ලද අංක 1543 දරන සැලැස්මේ කැබලි අංක 2 ;
*නැගෙනහිරට* : කේ. එම් .අප්පුහාමි හිමිකම් කියන ඉඩම ;
*දකුණට* : බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක මහතා විසින් මැන සකස් කරන ලද අංක 1543 දරන සැලැස්මේ කැබලි අංක 4 ;
*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. ආර්. පී. ඉන්ද්‍රා පද්මලතා මහත්මිය,
නාත්තණ්ඩිය පාර,
උඩුබද්දාව.

EOG 12 - 0172

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, වැලිමඩ අදියර 2 ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ කැබිල්ලේගම ජල ගබඩා ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/03/BD/326.

2021 දෙසැම්බර් මස 13 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 52ඞී, කැබිල්ලේගම ග්‍රාම නිලධාරි වසමේ කැබිල්ලේගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ගෝඨාභය වනසිංහ මහතා විසින් 2021.08.25 දිනින් අදින ලද අංක 2021/84 සැලැස්මේ කැබලි

අංක 1 ලෙස දැක්වෙන වලස්බොක්ක ඇල්ලේපතන නමැති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0319ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

*උතුරට* : අවසන් ගම් පිඹුර 65 හි කැබලි අංක 154 හා 155 ;
*නැගෙනහිරට* : අංක 2021/84 සැලැස්මේ කැබලි අංක 2 ;
*දකුණට* : අවසන් ගම් පිඹුර 65හි කැබලි අංක 156 ;
*බටහිරට* : අවසන් ගම් පිඹුර 65හි කැබලි අංක 146 හා 156.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. එච්. ජී. සිරියාවතී,
අංක 20, කැබිල්ලේගම,
වැලිමඩ.

EOG 12 - 0173

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, වැලිමඩ අදියර 2 ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ගුරුතලාව මාවිතිකුඹුර ජල ගබඩා ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/03/BD/327.

2021 දෙසැම්බර් මස 13 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 52සී, මාවිතිකුඹුර ග්‍රාම නිලධාරි වසමේ මැටිකුඹුර ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ගෝඨාභය වනසිංහ මහතා විසින් 2021.08.25 දින අඳින ලද අංක 2021/84 සැලැස්මේ කැබලි අංක 1 ලෙස දක්වෙන කිරිමැටියකදුලේපහන නමැති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0430ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

මායිම් :

*උතුරට* : කැබලි අංක 150 (අවසන් ගම් පිඹුර 454හි කොටසක්) ;
*නැගෙනහිරට* : කැබලි අංක 150 (අවසන් ගම් පිඹුර 454හි කොටසක්) ;
*දකුණට* : කැබලි අංක 150 (අවසන් ගම් පිඹුර 454හි කොටසක්) ;
*බටහිරට* : අවසන් ගම් පිඹුර 189හි කැබලි අංක 146.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. ශ්‍රියා චාන්දනී වීරසිංහ,
කෙරඳිමුල්ල ෆාම්,
ගුරුතලාව.

EOG 12 - 0174

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.